# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව කාලය : පැ. 02

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 15 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරායටින් ඉරක් අඳින්න.

(1) නාට්‍යයක් නිර්මාණය කිරීම
- i) තනිව සිදු කළහැකි ක්‍රියාවකි
- ii) සාමූහිකව කළයුතු කාර්යකි
- iii) ඕනෑම අයෙකුට නිර්මාණය කළහැකිය
- iv) ඉතාමත් පහසු කාර්යකි

(2) නාට්‍යක ප්‍රධාන අරමුණ වන්නේ
- i) උපදේශයක් ලබා දීමය
- ii) දැනුමක් ලබාදීමය
- iii) රසයක් ලබාදීමය
- iv) කථාවක් කියා දීමය

(3) ගැමියන් විසින් නිර්මාණය කරන ලද කථා වන්නේ
- i) ජන කතා
- ii) ජාතක කතා
- iii) නව කතා
- iv) වංශ කතා

(4) ජන කතා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ
- i) ජන කතාව කියවීමෙන් රස විඳිය හැක
- ii) සරල භාෂාවක් භාවිතා කරයි
- iii) ජන කතා සම්බන්ධ අතුරු කතා රාශියකි
- iv) මුල මැද අග සහිතව ගෙතී ඇත.

(5) රංග අභ්‍යාස කිරීම අවශ්‍ය වන්නේ
- i) නිෂ්පාදකවරයාටය.
- ii) නාට්‍ය අධ්‍යක්ෂක වරයාටය
- iii) නළු නිළියන්ටය
- iv) ප්‍රේක්ෂකයන්ටය

(6) අනුකරණය යන්නෙන් අදහස් වන්නේ
- i) සිදුවීමක් අනුමාන කිරීමයි
- ii) තවත් කෙනෙකුට අවමාන කිරීම
- iii) අශාසනා කිරීම
- iv) අනුව ක්‍රියා කිරීමයි

(7) නාට්‍යයක් නරඹන පිරිස හඳුන්වන්නේ
- i) නළුවන්ය
- ii) අධ්‍යක්ෂක වරයාය
- iii) ප්‍රේක්ෂකයන්ය
- iv) ආලෝක ශිල්පීන්ය

(8) නාට්‍ය කලාව හා ටෙලිනාට්‍ය අතර දැකිය හැකි ප්‍රභල වෙනස්කමකි
- i) සංවාද භාවිතය
- ii) පිටපතකින් යුක්ත වීම
- iii) සජීවී බව
- iv) අංග රචනය යොදා ගැනීම

(9) ශිථිලකරණය යන්නෙන් අදහස් කරන්නේ
- i) සතර අභිනය මගින් රූපනය කිරීම
- ii) ශරීරය සැහැල්ලු කිරීමයි.
- iii) රංගනයට පෙර මානසික සූදානමයි
- iv) ශරීරය සිසිලකර ගැනීමයි

(10) නාට්‍යයක් යනු
- i) යමක් කර පෙන්වීමකි
- ii) අසා රසවිඳීය හැක්කකි
- iii) නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ගෙනඑනු ලබන මාධ්‍යයයි
- iv) හොඳ තිර නාට්‍යයකි

(11) නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන එනු ලබන්නේ
- i) සතර අභිනය මගිනි
- ii) සංවාද මගිනි
- iii) අනුකරණය මගිනි
- iv) අභිරූපණ මගිනි

(12) පෙර සූදානමක් නොමැතිව සිදු කරන රංගනයකි.

i) ක්‍ෂණික නිරූපණයයි
ii) අනුකරණයයි
iii) අභිරූපයක්
iv) අනුරූපණයයි

(13) වර්තමානයේ බහුලව භාවිත වන රංග භූමිය වන්නේ

i) කවාකාර රඟ මඩල
ii) කමත
iii) පින්තූර රාමු වේදිකාව
iv) කරලිය

(14) නළු වරණය යනු

i) නාට්‍ය පිටපත තෝරා ගැනීමයි
ii) නාට්‍ය අධ්‍යක්‍ෂකවරයෙකු තෝරා ගැනීමයි
iii) උචිත නළු නිළියන් තෝරා ගැනීමයි
iv) මුදල් යොදවන්නන් තෝරා ගැනීමයි

(15) ආහාර්ය අභිනයට අයත් වන්නේ

i) රංග වස්ත්‍රාභරණ, සංගීතය, පසුතල නිර්මාණ
ii) නළුවා, පසුතල නිර්මාණ, සංවාද සංගීතය
iii) සංවාද සංගීතය, ආලෝකකරණය
iv) වේෂභූෂණ, රංගභූමි, අංග රචනය

- හිස්තැනට ගැලපෙන පිළිතුර කොටුව තුළින් තෝරා ලියන්න.

**අවමංගල උත්සවය, කියවා හෝ අසා, එකම චරිතයක විවිධ පැතිකඩ, පණිවිඩයක්, නාට්‍යක්.**

(16) ........................................................................................... රඟ දැක්වීම භූමිකාව වේ.
(17) .................................................... සාමාන්‍ය ජීවිතයේ නාට්‍යෝචිතව රඟ දැක්විය හැකි අවස්ථාවකි.
(18) කතන්දරයක් .................................................. රස විඳිය හැක.
(19) .................................................. තුළින් ප්‍රේක්‍ෂකයාට ගැඹුරු ජීවිතාවබෝධයක් ලබාදිය හැක.
(20) කතාවක් තුළින් යම් .................................................. ප්‍රකාශවීම තේමාව වේ. ( ල 1 x 20 = 20 )

**11 කොටස**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න 03 නයි.)

(1)
i) ක්‍ෂණික නිරූපණය යනු කුමක්ද? (ල 03)
ii) සාමූහික ක්‍ෂණික නිරූපණයට අදාළ මාතෘකා 03 ක් ලියන්න. (ල 03)
iii) ක්‍ෂණික නිරූපණය මගින් ශිල්පීන්ට ලැබෙන පිටුවහල විස්තර කරන්න. (ල 04)

(2)
i) වේෂභූෂණ යනු කුමක්ද? (ල 03)
ii) නාට්‍යකට වේෂභූෂණ සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ල 03)
iii) රාජ කුමාරියකට/රාජ කුමාරයෙකුට උචිත පැළඳුම් (ආභරණ) ඇඳ වර්ණ නම් කරන්න. (ල 04)

(3)
i) රංග භූමියක් යනු කුමක්ද? (ල 03)
ii) රංග භූමියක තිබිය යුතු මූලික ලක්‍ෂණ 03 ක් ලියන්න. (ල 03)
iii) ඔබ ඉගෙන ගත් රංග භූමියක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ල 04)

(4) ඔබ කැමති තේමාවක් නම් කර ඒ ඇසුරින් නාට්‍යය පිටපතක් රචනා කරන්න. (ල 10)